**හොරණ නගර සභාව - 2020**

**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------------**

හොරණ නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට හොරණ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**--------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභයන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) ( ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට විදුලි තොග, මුද්‍රණ තොග, ආයුර්වේද ඖෂධ සහ ලිපිද්‍රව්‍ය තොගවල එකතුව රු.4,234,682 ක් අවසාන තොග වටිනාකම ලෙස ගිණුම්වල දක්වා තිබුණද, පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 5.11 ප්‍රකාරව FIFO ක්‍රමය උපයෝගි කරගෙන තොග ඇගයීම කලයුතු වුවද, ඊට පටහැනි අයුරින් අවසන් තොග ඇගයීම් කර තිබුණි. | තොග FIFO ක්‍රමයට ගිණුම්ගත කලද ඇතැම් තොග එසේ ගිණුම්ගත කර නොමැති අතර ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව | ප්‍රමිත අනුව නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 3.29 ප්‍රකාරව ස්ථාවර තැන්පතු උපලබ්ධියෙන් ලද රු.6,906,697 ක වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වුවද, එම අගය දක්වා නොතිබුණි. තවද, වර්ෂයේ මුදලින් ලද පොළි ආදායම වූ රු.4,500,785 අගය ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ලද පොළී මුදල් ලෙස මුදල් ප්‍රවාහයේ දැක්විය යුතු වුවද, එපරිදි දක්වා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ප්‍රමිත අනුව නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බාහිර ප්‍රතිපාදන යටතේ ලැබුණු හා ලැබිය යුතු ප්‍රාග්ධන ප්‍රදාන රු.12,433,218 කර්මාන්ත ණයගැති වත්කම් හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ආදායම් වශයෙන් දක්වා නොතිබුණි | බාහිර ආයතනවලින් ලැබෙන මුදල් පොදු තැන්පත් හරහා ගිණුම්ගත කල අතර ඉදිරියේදී නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ බාහිර ප්‍රතිපාදන යටතේ ලැබුණු රු.10,747,603 ක් කර්මාන්ත මුදල් පොතේ ලැබීම් ලෙස සටහන් කලද, ණයගැති ගිණුමේ දක්වා නොතිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | |
| (ඇ) | කර්මාන්ත ලැබිය යුතු ණයගැති ශේෂය රු.1,685,733 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.1,694,333 ක් ලෙස දක්වා තිබීම නිසා ලැබිය යුතු ශේෂය රු.8,440 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ බාහිර ප්‍රතිපාදන යටතේ ණයහිමියන් සඳහා ගෙවූ හා ගෙවිය යුතු රු.20,258,265 ණයහිමි ගිණුමට හා එමගින් ජනනය වන වත්කම් මාර්ග හා බෝක්කු යටතේ දේපල පිරියත හා උපකරණ වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් වශයෙන් 2021 වර්ෂයේ සිට නිවැරදිව ගිණුම්ගත කිරිමට කටයුතු කරන බව | |
| (ඉ) | සභා ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති 12 ක් සඳහා ණයහිමියන් වශයෙන් වෙන් කල යුතු රු.7,825,047 ක් වෙනුවට රු.8,050,000 ක් වෙන්කර තිබුණි. | ණයහිමි වශයෙන් ව්‍යාපෘති නිමවන අවස්ථාවේ වෙන් කලද, මුදල් ගෙවන අවස්ථාවේදී සම්පූර්ණ මුදල් නොගෙවීම මීට හේතු වූ බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය තුල මිලදී ගන්නා ලද රු.42,228 ක් වූ ප්ලාස්ටික් පුටු 50 මූල්‍ය ප්‍රකාශනවල කාර්යාල උපකරණ හා හුවමාරු නොවන ගණුදෙනු වලින් ලත් අයභාරය යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | |
| (උ) | සමාලෝචිත වර්ෂයේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ හා පරිගණක මිලදී ගැනීම රු.1,692,565 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.1,492,565 ක් ලෙස රු.200,000 අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | |
| (ඌ) | මෝටර් රථ ප්‍රත්‍යාගණන වටිනාකම රු.95,275,657 ක් වෙනුවට එය රු.69,231,790 ක් ලෙස ගිණුම්ගත කිරිම නිසා දේපල පිරියත හා උපකරණ වල මෝටර් රථ අගය රු.26,043,867 ක් හා සංචිත වටිනාකම එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | |

| | | | |
|---|---|---|---|
| (එ) | යන්ත්‍ර ප්‍රත්‍යාගණන වටිනාකම රු.6,638,500 ක් වෙනුවට එය රු.7,288,690 ක් ලෙස සටහන් කිරීම නිසා දේපල පිරියත හා උපකරණ වල යන්ත්‍ර වටිනාකම රු.650,190 ක් හා සංචිත වටිනාකම එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | |
| (ඒ) | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ගෙවිය යුතු රු.9,400 වෙනුවට ණයහිමි වශයෙන් රු.40,492 ක් ගිණුම්ගත කිරීම නිසා ගෙවිය යුතු ණයහිමි ශේෂය රු.31,092 ක් වැඩියෙන් සටහන් කර තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | |
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු මුද්දර ගාස්තු බිල් කිරීම් වටිනාකම රු.15,000,000 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි. | වාර්ෂික බිල් කිරීමට ඇතුලත් කලහොත් මූල්‍ය ප්‍රකාශනවල ආදායම් අසාමාන්‍ය ලෙස වැඩියෙන් පෙන්විය හැකි අතර උපචිත ප්‍රමාණය සත්‍ය ලෙස ලබාගෙන වාර්ෂික ගිණුමට ඇතුලත් කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඕ) | හුවමාරු ගණුදෙනු වලින් ලත් අයභාරය යටතේ ආදායම් , වියදම් ගිණුමට රු.915,749 ක් වෙනුවට රු.136,688 ක් ලෙස සටහන් කිරීම නිසා ආදායම රු.779,061 අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | |
| (ක) | භෞතික ගැලපුම් මංමාවත් යටතේ වැඩ සටහන් අංක 07 හි වෙනත් විකුණුම් ආදායම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල රු.225,100 ක් සටහන් කිරීම වෙනුවට එය රු.443,014 ක් ලෙස සටහන් කිරීම නිසා රු.217,917 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | |
| (ග) | පොදු පරිපාලන වැඩසටහන් අංක 01 හි අළුත්වැඩියා හා නඩත්තු වියදම් වටිනාකම රු.1,316,956 ක් වුවත්, එය රු.400,981 ක් ලෙස දක්වා තිබීම නිසා වියදම රු.915,975 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | |
| (ජ) | සභාව සතු ඉඩම් කැබලි 44 වටිනාකම වූ රු.2,352,761 ක් හා ගොඩනැගිලි වටිනාකම රු.305,500,000 ක මුදල තක්සේරු දෙපාර්තමේන්තුවෙන් විධිමත් තක්සේරුවක් ලබා ගැනීම වෙනුවට සභා නිලධාරින්ගෙන් සැදුම්ලත් කමිටුවක් මගින් තක්සේරු කර තිබුණි. | වත්කම් තක්සේරු කර 2021 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ට) | නගර සභා කාර්යාල ගොඩනැගිල්ලෙ ස්ථාවර වත්කම් ලේඛනයේ පිරිවැය රු.307,757,445 ක් ලෙස හඳුනාගෙන තිබුණ ද, සභා තක්සේරු මණ්ඩලයෙන් එය රු.30,000,000 කට තක්සේරු කිරීම නිසා රු.277,757,445 ක් අඩුවෙන් සටහන් කර තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | |
| (ඩ) | අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයේ 2019 වර්ෂය අවසානයේ මුදලින් හා පරිත්‍යාග වශයෙන් ලබාගෙන තිබුණු ට්‍රැක්ටරයේ හා ට්‍රේලරයේ වටිනාකම රු.1,965,400 වුවත් මූල්‍ය ප්‍රකාශනවල වත්කම් වශයෙන් රු.1,900,000 ලෙස රු.65,400 ක් අඩුවෙන් සටහන් කර තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | |
| (න) | 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සේවක වැටුප් ප්‍රතිපූර්ණ ආදායම රු.110,893,271 ක් ලෙස ගිණුම්වලට ගතයුතු වුවද, එම අගය රු.111,067,451 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් වර්ෂයේ ආදායම රු.174,179 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ම) | 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු සභික දීමනා රු.195,000 ක් 2021 ජනවාරි 06 දින සභාවට ලැබී තිබුණ ද එම අගය අවසාන ගිනුම්වල ජංගම වත්කම් යටතේ දක්වා නොතිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | |
| (ප) | 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.4,090,730 ක් ලෙස ගිණුම්වලට ගැලපිය යුතු වුවද, එම අගය රු.5,026,395 ක් ලෙස ගැලපීමෙන් වර්ෂයේ ආදායම රු.935,665 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | |
| (බ) | 2020 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු රු.53,233,773 ක් ලෙස ජංගම නොවන වත්කම් යටතේ දැක්විය යුතු වුවත්, එම අගය රු.52,547,256 ක් ලෙස දැක්වීමෙන් එම අගය රු.686,517 ක් අඩුවෙන් දක්වා තිබුණි. තවද, 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලී ආදායම රු.735,087 ක් ලෙස ජංගම වත්කම් යටතේ දැක්විය යුතු වුවද, එම අගය රු.360,947 ක් ලෙස දැක්වීමෙන් ජංගම වත්කම් වල අගය රු.374,140 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | |

**1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 04 කට අදාල ශේෂයන් හා ඒවාට අදාල උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.980,887 ක වෙනසක් නිරීක්ෂණය විය. | ගිණුම නිවැරදි කිරීමට කටයුතු කරන බව | අදාල ශේෂ වල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.35,107,130 ක් වු ගිණුම් විෂයයන් 02 කට අදාලව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී ලබා දීමට කටයුතු කරන බව | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු5,320,659 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,703,016 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යනාදිය සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දිළිදුකම පිටුදැකිමේ උපාය මාර්ගික වැඩ සටහන යටතේ වෙළඳකුටි 04 රු.574,000 ක වියදමක් දරා සභාව විසින් ඉදිකර බදුකරු වෙත ගිවිසුම් ප්‍රකාරව ලබාදී තිබුණ ද, එය රු.3,984 බැගින් වාරික 36 කින් බදුකරු විසින් ගෙවිය යුතු වුවත්, එම මුදල් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | දිළිඳු ජනතාවගේ ජීවන තත්වය නඟා සිටුවීම සඳහා අඩු ආදායම්ලාභී පවුල් 04 තෝරාගෙන කිරි/කැඳ ව්‍යාපෘතිය සඳහා මෙම වෙළඳකුටි ලබාදී එක් පුද්ගලයෙකු විසින් රු.7,000 ක් බදුකුලී වශයෙන් ගෙවීමටත් අඩු ආදායම් ලාභින් වශයෙන් මෙම මුදල | ගිවිසුම් ප්‍රකාරව වෙළඳකුටි සඳහා බදුකරු විසින් මුදල් ගෙවීම් කළ යුතුය. |

| | | |
|---|---|---|
| | ගෙවිය නොහැකි බව සභාවෙන් ඉල්ලීම් කර ඒ අනුව ඉදිරියේදී සභාවට යොමු කර තීරණයක් ගන්නා බව | |
| (ආ) පැරණි නගරසභා ගොඩනැගිල්ල අසල වූ කිරිහල ලබාගත් අය විසින් එකී කිරිහල නොදන්වා වසා තබා තිබූ අතර එහි තිබූ සභාව විසින් ලබාදුන් ගෑස්ලිප දිරාපත්ව තිබීමත් එකී අලාභය අදාල පුද්ගලයාගෙන් අය කිරීමට කටයුතු නොකර වෙනත් අයෙකු වෙත කිරිහල බදුදී තිබුණි.තවද බදුදී තිබූ කිරිහල් 04 න් 2020 අවසන් වන විටත් අයවිය යුතුව තිබූ රු.90,000 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කිරිහල ලබාගත් පුද්ගලයින් කිසිදු දැනුම්දීමකින් තොරව වසා තිබුණු අතර එය නැවත භාණ්ඩ සමඟ බාරදීමට කටයුතු කල නොහැකි නිසා වෙළඳ කුටිය විවෘත කර වෙනත් පුද්ගලයෙකුට ලබාදී තිබුණි. තවද මොවුන් අඩු ආදායම්ලාභින් බැවින් තිරණය සභාවට යොමු කර අවශ්‍ය කටයුතු ඉදිරියේදී ගන්නා බව | සභාවෙන් ලබාදී තිබුණු උපකරණ සභාවට නැවත භාර ගැනීමට හා බදුකරුගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ)ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය සමඟ වසර 03 ක් සඳහා ගිවිසුම්ගත වී එකී ආයතනය 2018 වර්ෂයේදී පළාත් පාලන පද්ධතිය හඳුන්වා දී තිබියදී නැවත 2019 වර්ෂයේදී වෙනත් පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කර තිබුණි. | ස්ථාපිත කර තිබුණු පරිගණක මෘදුකාංග පද්ධතියේ ක්‍රියාකාරිත්වය මත නව පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීමට සිදු වූ බව | ස්ථාපිත කර තිබුණු පරිගණක පද්ධතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳව නිසි අධ්‍යනයක් නොමැතිව වෙනත් පරිගණක පද්ධති ස්ථාපිත කිරීමට කටයුතු නොකළ යුතුය. |
| (ඈ) නව පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීමේදී ඒ සඳහා සුදුසුකම් ලත් ආයතන 02 කින් අවශ්‍ය පිරිවිතර සකස් කර දෙන ලෙසට ඉල්ලීම් කර තිබුණ ද ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් පමණක් පිරිවිතර ලැබී තිබුණි. | සභාව විසින් එක් ආයතනයක් වෙත කරන ඉල්ලීම මත පිරිවිතර සකස් කර ගැනීමට කටයුතු කළයුතු බව | ඒ සඳහා සුදුසුකම් ලත් ආයතන 02 මගින් පිරිවිතර ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) ඉහත කී මිලදී ගැනීම සඳහා ආයතන දෙකකින් මිල ගණන් ඉදිරිපත් කර තිබූ අතර රු.2,088,000 ක් වූ අවම මිල නොසලකා හැර රු.5,885,000 ක් වූ මිලකට අදාල සේවය නෙක්ෆා ඕස්ට්‍රේලියා පුද්ගලික සමාගමින් ලබා ගැනීම සඳහා තාක්ෂණ ඇගයීම් කමිටුව තීරණය කර තිබුණි. | සභාවේ තාක්ෂණික පිරිවිතර වලට අනුව ඇඟයීම් කමිටු නිර්දේශය මත මහ සභා අනුමැතිය මත මිලදී ගත් බව | ඉදිරිපත් කර තිබූ අවම මිල නොසලකා හැරීමට හේතු තාක්ෂණ ඇගයීම් වාර්තාවෙන් ඉදිරිපත් කළයුතුය. |
| (ඊ) මෙම මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීම වෙනුවෙන් 2020 මාර්තු මාසයේදී රු.2,992,475 ක මුදලක් ගෙවා තිබුණද එකී ගෙවීම් සිදු කිරීමට පෙර ස්ථාපිත පද්ධතියේ සාර්ථකත්වය පිළිබඳව සහතික කිරීමක් තාක්ෂණ ඇගයීම් කමිටුව වෙතින් ලබාගෙන නොතිබුණි. | පද්ධතියේ සාර්ථකත්වය පිළිබඳව එක වර සිදු කර නොහැකි අතර දත්ත ඇතුලත් කරල ක්‍රියාකාරිත්ව පරීක්ෂා කර බලා අදාල නිලධාරින්ගේ තහවුරුවක් ලබාගෙන ඇති බව | පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීමෙන් පසු ගෙවීම් කිරීම සඳහා තාක්ෂණික කමිටු වාර්තාවන් මත ක්‍රියාකාරිත්වය ඇඟයීම් කර ගෙවීම් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (උ) ඉහත කී ගෙවීම් සිදු කලද 2020 සැප්තැම්බර් 21 දක්වා තොග හා ගබඩා කළමනාකරණය සම්බන්ධයෙන් මෘදුකාංග පද්ධතියක් ක්‍රියාත්මක නොවූ අතර ඒ වෙනුවෙන් රු.690,000 ක මුදලක් ගෙවා තිබුණි. | ගබඩා ශේෂය සම්බන්ධයෙන් තොරතුරු ඇතුලත් කිරීම ජාලගත කිරීමේ දෝෂයක් මත ප්‍රමාද වී තිබූ අතර කොරෝනා තත්වය මත පද්ධතිය ස්ථාපිත කල ආයතනය සම්බන්ධ කර ගැනීමට නොහැකිවීම නිසා ඉදිරියේදී නිසි ආකාරයට පවත්වා ගැනීමට කටයුතු කරන බව | මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කර ක්‍රියාකාරිත්වය ඇගයීම් කර ගෙවීම් සිදු කළයුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)සභාවේ ලේකම් තනතුර සඳහා පරිපාලන සේවයේ නිලධාරියෙකු සිටිය යුතු වුවත්, කළමනාකරණ සේවා නිලධාරියෙකු පත් කර තිබුණි. | පවතින පුරප්පාඩු සභාව දැනුම්දී ඇති අතර පුරප්පාඩුව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිසම මගින් සම්පූර්ණ කර නොමැති බව | පුරප්පාඩු සම්පූර්ණ කිරිමට කටයුතු කළ යුතුය. |
| (ආ)ආයුර්වේද වෛද්‍ය නිලධාරි තනතුරක පුරප්පාඩුවක් නොතිබියදී තාවකාලික පදනමින් එක් වෛද්‍යවරයෙකු බඳවාගෙන තිබුණි. | අනුමත වෛද්‍ය නිලධාරියාගේ නිවාඩු ආවරණය කර ගැනීම සඳහා මෙසේ පත්කර ඇති අතර තවත් වෛද්‍ය තනතුරක අවශ්‍යතාවය පවතින බැවින් අනුමත කරවා ගැනීමට කටයුතු කරමින් පවතින බව | පුරප්පාඩු තනතුරු සඳහා පමණක් බඳවා ගැනීම් සිදු කළ යුතුය. |
| (ඇ) පෙර පාසැල් ගුරු සහායක තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමත කාර්යය මණ්ඩලයෙහි සේවක සංඛ්‍යාවක් දී නැති නමුත් අනියම් හා තාවකාලික පදනමින් තිදෙනෙකු බඳවාගෙන තිබුණි. | පෙර පාසැල් අරමුදලින් දීමනා ගෙවීමට යටත්ව බඳවාගත් බව | පුරප්පාඩු තනතුරු සඳහා පමණක් බඳවා ගැනීම් සිදු කල කළ යුතුය. |